පිටුව 22

2019 ඔක්තෝබර් මස 01 වැනිදා අඟහරුවාදා දිවයින

# 2019 ආර්ථික වර්ධනය 2.7% ක් දක්වා අඩුවේ

## 2020 දී 3.5% ක ආර්ථික වර්ධනයක්

## ජාත්‍යන්තර මූල්‍ය අරමුදල කියයි

ශ්‍යාම් නුවන් ගනේවත්ත

**මෙ වසරේ (2019) ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය සියයට 2.7 ක් දක්වා අඩුවනු ඇතැයි ජාත්‍යන්තර මූල්‍ය අරමුදල පවසයි.**

සංචාරක පැමිණීම් සහ ඒ ආශ්‍රිත කටයුතු ක්‍රමානුකූලව යථා තත්ත්වයට පත්වීමත් සමග 2020 වසරේදී ආර්ථික වර්ධනය සියයට 3.5 ක් දක්වා ඉහළ යනු ඇතැයිද එම අරමුදල විසින් පුරෝකථනය කර ඇත.

සිව් අවුරුදු විස්තීර්ණ ණය පහසුකම් සැලසුම යටතේ ක්‍රියාත්මක කෙරෙන ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රතිසංස්කරණ වැඩසටහන යටතේ හය වැනි සමාලෝචනය පැවැත්වීම සඳහා මැනුඑලා ගොරෙති මහත්මියගේ ප්‍රධානත්වයෙන් යුතු මූල්‍ය අරමුදලේ නිලධාරී කණ්ඩායමක් 2019 සැප්තැම්බර් 10-25 කාලය තුළ දී කොළඹට පැමිණි අතර සිය සංචාරය අවසානයේ ගොරෙති මහත්මිය විසින් සිදුකරන ලද ප්‍රකාශයේ එසේ සඳහන් වේ.

එහි මෙසේද සඳහන්ය.

විස්තීර්ණ ණය පහසුකම යටතේ ක්‍රියාත්මක කෙරෙන වැඩසටහනෙහි හය වැනි සමාලෝචනය පිළිබඳව ජා. මූ. අරමුදලේ නිලධාරී කණ්ඩායම සහ ශ්‍රී ලංකා බලධාරීන් අතර අවබෝධතාවන්ට එළඹිණි. මෙම සමාලෝචනය සඳහා සපුරාලිය යුතු සියලුම කාර්යයන් සහ ව්‍යුහාත්මක මිණුම් දඬු නිම කිරීමට අවශ්‍ය පියවර ඊළඟ සති කිහිපය තුළ බලධාරීන් විසින් ගනු ඇත.

අප්‍රේල් මාසයේ දී සිදුවූ ඛේදනීය ත්‍රස්ත ප්‍රහාරයෙන් පසුව රටේ ආරක්ෂක තත්ත්වය යථා තත්ත්වයට පත් කිරීම සහ ඉන් ආර්ථිකයට ඇතිවූ කම්පනයෙහි බලපෑම අවම කිරීමට බලධාරන් විසින් ගනු ලැබූ උත්සාහයන් දූත පිරිසේ පැසසුමට ලක්වේ. 2019 වසර සඳහා වූ මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ (ද. දේ. නි. යේ) වර්ධනය සියයට 2.7 ක් ලෙස සංශෝධනය කර ඇති අතර සංචාරක පැමිණීම් සහ ඒ ආශ්‍රිත ආර්ථික කටයුතු ක්‍රමානුකූලව යථා තත්ත්වයට පත්වීම සමඟ 2020 වසරේදී ද. දේ. නි. යේ වර්ධනය සියයට 3.5 ක් දක්වා ඉහළ යනු ඇතැයි පුරෝකථනය කෙරේ. 2019-20 කාලපරිච්ඡේදය තුළ දී උද්ධමනය සියයට 4.5 ක් පමණ ස්ථායී මට්ටමක පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෑතකාලීනව සංචාරක පැමිණීම් සහ විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ අඩු වුවද 2018 වසර අවසානයේ සිදුවූ විනිමය අනුපාතිකයේ ගැලපීම ආධාරයෙන් ආනයන පහළ යාම සහ අපනයන ශක්තිමත් වීම හමුවේ 2019 වසරේදී ජංගම ගිණුමේ හිඟය ද. දේ. නි. යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 2.6 ක් දක්වා පහළ යනු ඇතැයි පුරෝකථනය කෙරේ.

මන්දගාමී ගෝලීය පෙරදැක්ම සහ ශ්‍රී ලංකාවේ ඉහළ රාජ්‍ය ණය ප්‍රමාණය හමුවේ සාර්ව ආර්ථික ස්ථායිතාව පවත්වා ගැනීමට විචක්ෂණශීලී ප්‍රතිපත්ති පවත්වාගෙන යාම සහ ආයතනික ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම තීරණාත්මක වේ.

2018 වසරේ දී වූ දේශපාලනික අස්ථාවරභාවය සහ පාස්කු ප්‍රහාරයන්හි ප්‍රතිඵල, රාජ්‍ය මූල්‍ය ක්‍රියාකාරිත්වය කෙරෙහ සැලකියයුතු බලපෑමක් ඇති කරයි. 2018 වසරේ සිට ඉදිරියට ගෙන එන ලද විදේශීය මූල්‍යනයන්ගෙන් යුතු ප්‍රාග්ධන ව්‍යාපෘති සහ හිඟ මුදල් පියවීම හේතුවෙන් වසරේ මුල් කාලය තුළදී වියදම් එක්රැස් වීම මෙන්ම ත්‍රස්තවාදී ප්‍රහාරයන්ගෙන් පසුව වක්‍ර ආදායම් තියුණු ලෙස පහළ යෑම හේතුවෙන් ජූනි අග රාජ්‍ය මූල්‍ය ඉලක්කය විශාල ප්‍රමාණයකින් මඟ හැරිණි. පස්වන සමාලෝචනයේ දී එකඟතාවකට පැමිණි වැඩසටහන් ඉලක්ක තවදුරටත් ළඟා විය නොහැකි මට්ටමක පැවතුනද, 2019 අයවැයෙහි ඉතිරිව ඇති ආදායම් සම්බන්ධ ක්‍රියාමාර්ග ක්‍රියාවට නැංවීම සහ විචක්ෂණශීලී වියදම් කළමනාකරණය තුළින් 2019 වසරේ දී ද.දේ. නි.යේ ප්‍රතිශතයක් ලෙස සියයට 0.2 ක ප්‍රාථමික රාජ්‍ය මූල්‍ය අතිරික්තයක් ළඟා කර ගැනීමට බලධාරීහු කැප වී සිටිති.

වැඩසටහන යටතේ අත්කර ගත් ප්‍රතිලාභ ආරක්ෂා කර ගැනීමට, ඉහළ මට්ටමක පවතින රාජ්‍ය ණය පහළ දැමීමට සහ වඩාත් ඉලක්කගත සමාජ සහ ප්‍රාග්ධන වියදම් සඳහා ඉඩකඩ සලසා දීමට මැදිකාලීනව සහ 2020 වසරේදී ආදායම් මත පදනම් වූ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාව ඉදිරියට ගෙන යෑම සඳහා බලධාරීන් දක්වන කැපවීම දූත මණ්ඩලයේ අගය කිරීමට ලක් විය. බදු පදනම පුළුල් කිරීම සහ බදු අනුකූලතාව සහතික කිරීම තුළින් රාජ්‍ය ආදායම් වර්ධනය කිරීම සහ වියදම් කළමනාකරණයෙහි කාර්යක්ෂමතාව ශක්තිමත් කිරීමට අඛණ්ඩව පියවර ගත යුතු වේ.

## විනිමය අනුපාතය

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2019/09/30 දින නිකුත් කළ අලුත්ම විනිමය අනුපාත අගයන් මෙසේය.

| මුදල් වර්ගය | ගැනුම් මිල | විකුණුම් මිල |
|---|---|---|
| ඔස්ට්‍රේලියානු ඩොලර් 1 ක් | රු.120.3702 | රු.125.4131 |
| කැනේඩියානු ඩොලර් 1 ක් | රු. 135.0155 | රු. 139.8297 |
| චීන යුවාන් (රෙන්මින්බි) 1 ක් | රු. 24.9505 | රු. 26.1088 |
| යූරෝ 1 ක් | රු.195.3925 | රු. 202.0915 |
| ජපන් යෙන් 1 ක් | රු. 1.6559 | රු. 1.7152 |
| සිංගප්පූරු ඩොලර් 1 ක් | රු.129.5898 | රු. 133.8300 |
| ස්ටර්ලින් පවුම් 1 ක් | රු.219.9739 | රු. 226.8741 |
| ස්විස් ෆ්‍රෑන්ක් 1 ක් | රු.180.3675 | රු. 186.5291 |
| ඇමෙරිකානු ඩොලර් 1 ක් | රු.179.8933 | රු. 183.5647 |

| මුදල් වර්ගය | පෙන්නුම් කරන අනුපාතය |
|---|---|
| බහරේන් ඩිනාර් | රු. 482.5719 |
| කුවේට් ඩිනාර් | රු. 599.0359 |
| ඕමාන් රියාල් | රු. 472.5443 |
| කටාර් රියාල් | රු. 49.9663 |
| සෞදි අරාබියා රියාල් | රු. 48.4997 |
| ඩිරාම් | රු. 49.5289 |